# බුලතේ වරුණ

**අපේ සංස්කෘතියේ බුලත දෙවැනි වන්නේ අපේ ආහාරය වන බතට පමණයි. විදේශ විනිමය මෙරටට ගෙනෙන මාර්ගයක් බවටද පත්වී ඇති නිසා බුලතට දැන් වාණිජමය අතිනුත් වැදගත් තැනක් හිමිවෙනවා. එහෙත්, බුලත නිපදවන ගොවියාගේ තත්ත්වය නම් එතරම් සතුටුදයක නෑ. ඔවුන්ගේ ප්‍රශ්න දෙස ඔවුන්ගේ ඇසින්ම බලන්නට කළ උත්සාහයකි මේ.**

**විමර්ෂක**

**ලලිත් ජයසූරිය**

**විසිනි.**

කාරුණු දෙකකට ගම්පහ ප්‍රසිද්ධයි. ගම්පහ බෙහෙත් ශාලාවක් නැතිනම් නගරයක් අංග සම්පූර්ණ නොවේ. ඒ පමණටම ගම්පහින් ගිය වෙද මහත්වරු රට දිනා ගත්හ. අනිත් අතින් ගම්පහ බුලත් ලංකාවේ වගේම ලෝකයේම ප්‍රසිද්ධයි. කැළණි ගඟෙනුත් මා ඔයෙනුත් මායිම් වන ගම්පහ දිස්ත්‍රික්කයේ වී ගොවිතැන් කරන, පොල් අක්කරයක් හමාරක් තිබෙන සුලු ගොවීන් බොහෝ දෙනාගේ අතුරු ආදයම් මාර්ගය බුලත් වගාවයි.

ආයුර් වේදයට අනුව සෞඛ්‍යය, ආහාර රුචිය, උද්යෝගය ප්‍රිය මනාප භාවය, අඩංගු ඖෂධීය ගුණයක් බුලතෙහි ඇත. සාහිත්‍යයේ විස්තර වන්නේ බුලත මිහිරි, කටුක, තිත්ත, කසට රසද, උණුසුම් වේ...... ආදී වශයෙනි. ලාංකීය ජනතාව අතර බුලත් අත සුභදත්වයේ හා ගෞරවනීයත්වයේ සංකේතයකි.

බුලත් ගන්නේ විට කෑමටයි. විටෙහි රුචිකත්වය පලින් පලට වෙනස් වේ. කලින් කලට අනික් හැම දේ මෙන්ම 'බුලත් විටත්' නවීකරණය වේ. ලංකාවේ බුලත් විටකට මූලික වශයෙන් අඩංගු වන්නේ බුලත්, පුවක්, හුණු සහ දුම් කොලය. අපේ රටේ විටක් සඳහා බුලත් කොළ 1–2 ක් අඩංගු වේ. එහෙත් පාකිස්ථානයේදී බුලත් විටකට වර්ග දහයක් පමණ සංයෝග වේ. එහි බුලත් අඩංගු වන්නේ කුඩා තීරුවකි. එරටේ අධික බුලත් මිල ද එයට හේතුවන්නට ඇත.

ගම්පහ සුළු ගොවීහු බුලතින් උපන් ජීවන රටාවක් උරුම කර ගත් බව කීවොත් නිවැරදිය. සතිය කට හෝ වරක් හිමිදිරි පාන්දර අවදි වී බුලත් තට්ටුව හිසමත තබා ගෙන අසල ඇති පොළට ගොස් විකිණීම එහි අංගයකි. පොළෙන් සතියටම අවශ්‍ය කනබොන දෑ පමණක් නොව අදින පළඳින දැත් මිලට ගෙන ඒම ඔවුන්ගේ සිරිතයි.

බුලත් වෙළඳ පොළ අනිකුත් පොළ වර්ගවලින් වෙනස්වේ. පාන්දර දෙකට තුනට පටන්ගෙන හය වන විට මිලට ගැනීම අවසන් කිරීම බුලත් වෙළෙඳුන්ගේ පුරුද්දයි. මීට හේතු කීපයකි. බුලත් ඉතා ඉක්මනින් නරක් වන සුලුය. ඒවා මිලට ගත් හනික වෙළඳ පළට යැවිය යුතුයි. රට මැද කඳුකරයට යැවුවත්. පාකිස්ථානයට යැවුවත්, දින තුන හතරකින් වෙළෙඳාම අවසාන කළ යුතුයි, නැතිනම් බරපතල පාඩු සිදුවිය හැකියි. ගම්පහ බුලතට වැඩි අගයක් ලැබෙන්නේ ඉක්මනින් නරක් නොවන සුලුවීම සහ සුමිහිරි රසයක් ඒ තුළ ගැබව තිබීම නිසයි. විශේෂයෙන්ම ගම්පහ නගරාසන්නයේ ප්‍රදේශවල ලංකාවේ ඉස්තරම්ම බුලත් නිෂ්පාදනය කෙරේ.

# බුලතින් වත් නැත

බුලත් ගොවීන්ගේ දිවි පෙවෙත පිළිබඳව අප වෙත කරුණු කීමට මුලින්ම ඉදිරිපත් වූයේ, මීරිගම හලුගම විදුහල්පති ඇල්. පී. ලීලාරත්න මහතායි. බුලත් වලින් වාසි ලබා ගැනීම ගොවීන්ගේ වාසනාව හෝ අවාසනාව මත සිදුවන දෙයක් විදියටයි බොහෝ දෙනා සිතන්නෙ උදහරණයක් ලෙසට කියනවා නම් සඳුද, පොළේ රුපියල් පණහට අලෙවි වුන බුලත් දහසක් අඟහරුවාද පොළේ රුපියල් පහට අලෙවි වූ අවස්ථා තියෙනවා. මෙතරම් මිල ඉහළ පහළ යන තවත් බෝගයක් නැතිතරම.''

ලීලාරත්න මහතා රැකියාවට අමතරව දක්ෂ ගොවියෙක්. බුලත් වෙළෙඳපලේ මිලට බලපාන කරුණු රාශියක් අපට විස්තර කර දුන්නා.

''ගහකොළ දළුලන
වැහි කාලයේ බුලත් දළු
ලියලෑම අධිකයි.
එයින් වෙළෙඳ පලට
අධිකව බුලත් සැපයෙනවා.
මින් බුලත් මිල ඉතාම
පහළ තත්වයට වැටෙනවා.
අනිත් අතට මැද පෙරදිග
දේශපාලන කලබැගෑනි
වලින් බුලත් පිටරට යැවීම
අඩාල වී මිල අඩුවීමට
හේතු වෙනවා.
ඒවගේම ලංකාවේ
වරින් වර ඇතිවන
ජාතිවාදී ගැටුම් බුලත් මිල
අඩුවීමට හේතුවේ.
මීට හේතු වන්නේ
බුලත් හපන වතුකරයේ හා
උතුරේ ජනතාවගේ
ජීවන රටාව අවුල්වූ විට,
ඒ ප්‍රදේශවලට බුලත් පැටවීම
අඩපණ වීමයි.''

අපේ සාකච්ඡාවට සහභාගි වුන අනික් ගොවි මහතා, යටගම පී.ඒ. පීරිස් අප්පුහාමි මහතායි. බුලත් වෙළෙඳ පලේ මෑත කාලයේ ඇති වූ වෙනස් වීම ඔහු පෙන්වා දුන්නා.

''පිටරට පැටවීමට පෙර
වෙළෙඳ පළේ වැඩි
මිලක් ලැබුනේ පීදුන
බුලතටයි.
කඳකොළ යැවවේ
වතුකරයේ ද්‍රවිඩයින්ටයි.
ඒ කාලයේ කඳකොළ වල
වටිනාකම අඩුයි.
කඳකොළ කියන්නේ
බුලත් පාත්තිවල
වැලෙන්ම එන කොළයි.
මේවා තද කොළ පාටයි.
ඒත් පකිස්ථානයේ
බුලත් හපන අය
වඩාත්ම කැමති තද
කොළ පාට
බුලත්වලට නිසා, දැන්
කඳ කොළ සඳහා ඉතාම
ඉහළ මිළ ලැබෙනවා''

බුලත් වෙළෙඳපල තුළ ඇත්තේ ඉතා සීමිත පාරිභෝගිකයින් සංඛ්‍යාවකි. උදහරණ වශයෙන් ලංකාවේ නව පරම්පරාවේ අය බුලත් හපන්නේ කලාතුරකිනි. මෙ පාරිභෝගික පිරිසත් විශේෂයෙන් වෛද්‍ය මත ප්‍රචාර මත අඩුවීමට ඉඩ ඇත.

නගර බද බුලත් විටක මිල ශත පහේ සිට හැත්තෑපහ දක්වා අධික වෙද්දීත්, බුලත්ගොවියාගේ ජීවන තත්වය එතරම් වෙනසක් වී නැහැ. ඔවුන්ගේ ප්‍රශ්න විස්තර කරමින් සාකච්ඡාවට එක්වුනා නයිවල ජේ. එම්. ඒ. ජයසේන මහතා.

''බුලත් ගොවීන්ගේ ප්‍රශ්න රාශියක් තියෙනව. මූලිකව අද බුලත් කොරටුවලට අවශ්‍ය කොවුල්, පුවක් පටි, කම්බි ආදිය ඉතාම ඉහළ මිලක් වෙනවා. අද බුලත් කොවුල් සීයක් රුපියල් හැත්තෑවකටත් අධිකයි. කලෑ එලි කිරීම නිසා කොවුල් කපාගන්නත් ඉඩක් නැහැ.

එද තිබුනු ලඳු කැලෑ වලින්
පිරුණු ගම්බද
ප්‍රදේශ අද නැහැ.
ගෙවල් හදන්න
බිම් කැබලි
යටවීම නිසා;
බුලත් කොටුවක් වවන්න
සුදුසු ඉඩමක්
සොයා ගැනීමත්
ලොකු ප්‍රශ්නයක්.''

# දුක්ගිනි නිවුනේ

''කොයි තරම් මහන්සි
වෙලා බුලත් වැවුවත්,
රෝග හැදුනොත් ඒකට
කිසිම බෙතක් නැහැ.
බුලත් වලට හැදෙන
'වයිරස්' රෝග සඳහා
තවමත් ප්‍රතිශක්ති කරණයක්
සොයා ගෙන නැහැ.''

රෝග නොසැදුනහොත් බුලත් කොරටුවක් අවුරුදු 10-15 ක් පමණ කල් පවත්වාගෙන යා හැකිය. ගොවීන් තම බුලත් කොරටු පූජනීය තත්වයෙන් ආරක්ෂා කරන අතර; පිටස්තර අයෙක් කොරටුවක් තුළට ඇතුල් වීම ගැන පවා බොහෝ දෙනා අකැමැතිය. මීට හේතුව බුලත් රෝග ඉක්මනින් බෝවෙන සුළු වීමයි. කෙසේ වුවද, රෝග සැදුනු බුලත් කොටුවක් සාර්ථක එළවළු කොරටුවක් බවට පෙරළා ගැනීමට ඔවුන් සතුව ඇත්තේ සහජ නිපුනත්වයකි.

ගම්පහ ගොඩ ගොවිතැන් කරන ගොවීන් එළවළු වගාවට වඩා බුලත්වගාවට මුල්තැනක් දෙන්නේ ඇයි? යන අතුරු ප්‍රශ්නයම පිළිතුරු දුන්නේ ලීලාරත්න මහතායි.

''අනිකුත් ගොඩ
බෝග වගේ නොවෙයි
බුලත් වලින්
සැම සති 2 කටම වරක්
ආදායම් ලබා ගත හැකියි.
මෙයට අමතරව
සැම බුලත් කොරටුවකම
වාගේ විවිධ එළවළු වර්ග
වවනවා.
විශේෂයෙන්ම බටු, මිරිස්
වැනි වර්ග
ගෙදරකට අවශ්‍යකරන
කහ, ඉඟුරු වැනි දේවල්
බොහෝ දුරට
බුලත් කොරටුවේ වවනවා.
ඒ නිසාම බුලත්
හත් අට දහසක් රැගෙන
පොළට යන ගොවියා අත
බටු ගෝනියක්,
මිරිස් ගොඩක්
අලෙවියට ගෙනයාම
සුලබ දර්ශනයක්.

අනිත් අතට බුලත් කොටුවක් අවුරුදු 10-15 ක් කල් පවත්වාගෙන යන්න පුලුවනි. මේ නිසා ගොවීන් අනිකුත් වගා වලට වඩා බුලත් වගාවට කැමතියි.''

බුලත් වගාවේ
නවීකරණයන් කිහිපයක්
සිදුව ඇත.
විශේෂයෙන්ම, අලු,
කැප්පෙටියා කොළ
සත්ව ඇටකටු
ආදියෙන් සාදගත් පෝර
මිශ්‍රණය වෙනුවට
අද භාවිතා කරනුයේ
රසායනික පොහොරය.
වතුර පොම්ප ආදිය
භාවිතා කර
බුලත් වගාව
මහා පරිමාණයෙන්
කරන ගොවීන් ඇත්තේ
කිහිප දෙනෙක් පමණි.
බුලත් දහසක
නිෂ්පාදන වියදම
රුපියල් විස්සක් පමණ
වන අතර;
අධික ලෙස සිදුවන
මිල වෙනස්වීම
ගොවීන්ට ඇති
බරපතලතම ප්‍රශ්නයයි.

බුලත් වෙළෙන්දට සාධාරණ මිලක් ලබාදීම සඳහා සමුපකාර සහ මාක්ෆෙඩ් ආයතනය ඉදිරිපත්ව ඇතත්, ඒ අයටත්, පෞද්ගලික අංශය සමග තරඟ කිරීම අපහසු බවයි. මේ ගැන සඳහන් කළ ලීලාරත්න මහතා ''මාක්ෆෙඩ් වගේ ආයතන මිලට ගන්නෙ ලොකු බුලත් පමණයි. එත කොට ගොවීන්ගේ කෙටි බුලත් ගන්න කෙනෙක් නැතිව යනවා. නමුත් පෞද්ගලික වෙළෙන්ද රට ඇතුළත හා පිටරට වෙළෙඳපළ රහස් වඩා හොඳින් දන්න නිසා; ඔවුන් සැම වර්ගයකම බුලත් මිලට ගන්නවා. අනිත් අතට බුලත් ඉක්මනින් නරක්වන සුලු නිසා; කඩිනමින් අලෙවි කිරීමේ නිපුණත්වය තියෙන්නේ පෞද්ගලික අංශයටයි.''